වාර්ෂික කාර්ය සාධන වාර්තාව
செயலாற்றுகை அறிக்கை
ANNUAL PERFORMANCE REPORT
2022



පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව
බී කොටස, 3 වන මහල, සෙත්සිරිපාය, II වන අදියර, බත්තරමුල්ල.

நன்னடத்தை, சிறுவர் பராமரிப்புச் சேவைகள் திணைக்களம்
பீ பிரிவு, 3 ஆம் மாடி, செத்சிறிபாய கட்டம் II, பத்தரமுல்லை.

Department of Probation and Child Care Services
Section B, 3rd Floor, Stage II, Sethsiripaya, Battaramulla

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுப்படுத்துகை அமைச்சு
Ministry of Women, Child Affairs and Social Empowerment

2022 වර්ෂය සඳහා

වාර්ෂික කාර්ය සාධන වාර්තාව

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය : 217

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව
බී කොටස, 3 වන මහල, සෙත්සිරිපාය II වන අදියර, බත්තරමුල්ල.

පෙළගැස්ම

01. ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය 1

1.1 හැඳින්වීම 2
1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු 3
1.3 ප්‍රධාන කාර්යයන් 4
1.4 සංවිධාන සටහන 5
1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ 6
1.6 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු 6

02. ප්‍රගතිය හා ඉදිරි දැක්ම 7

03. 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය 17

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය 18
3.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය 20
3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 21
3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් 23
3.5 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 24
3.6 මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 25
3.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 27
3.8 විගණකාධිපතිවරයාගේ වාර්තාව 28

04. ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 35

05. **තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය** 37

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු 38
5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 40

06. මානව සම්පත් පැතිකඩ 41

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 42
6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය බලපානු ලැබ ඇති ආකාරය 42
6.3 මානව සම්පත් සංවර්ධනය 42
6.4 ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන ආකාරය 44

07. අනුකූලතා වාර්තාව 45

01

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

වර්ෂ එක්දහස් නවසිය තිස් ගණන් වලදී ශ්‍රී ලංකාවේ අධිකරණය විසින් පරිවාස ක්‍රමය අත්හදා බැලීමක් වශයෙන් ක්‍රියාත්මක කරනු ලැබීය. 1907 දී එංගලන්තයේ සම්මත කරන ලද වරදකරුවන් පිළිබඳ පරිවාස ආඥා පනත ලංකා අධිකරණය කෙරේ ද බලපෑවේය. වර්ෂ 1944 දී සම්මත කරන ලද අංක 22 දරණ පරිවාස ආඥා පනත ඉහත සඳහන් කළ බලපෑම් වල ප්‍රතිඵලයක් විය. මෙම ආඥා පනත තුළින් පරිවාස ක්‍රමය ලංකා අධිකරණයේ ස්ථාපිත විය. එංගලන්තයේ පරිවාස සේවාව ඇසුරින් ලංකාවේ ද පරිවාස සේවාවන් ආරම්භ කිරීමේ කාර්යභාරය එංගලන්තයේ උපදේශකයෙකු වන එච්.ඒ.ලීඩින් මහතාට පැවරුණු අතර, ඒ අනුව බන්ධනාගාර දෙපාර්තමේන්තුව හා සම්බන්ධ පරිවාස සේවාව පරිවාස නිලධාරීන් කීපදෙනෙකුගෙන් ආරම්භ විය. අත්හදා බැලීමක් ලෙස දිවයිනේ අධිකරණ කොට්ඨාශ කීපයක පමණක් ක්‍රියාත්මක කිරීමෙන් පසු මෙම සේවය අධිකරණය විසින් පිළිගනු ලැබීය. ඉන්පසු එය වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය ද ඉස්මතු විය.

1949 දී විනිශ්චයකාර ග්‍රේෂියන් මහතාගේ ප්‍රධානත්වයෙන් පත්කරන ලද කමිටුවේ නිර්දේශ රජය විසින් පිළිගනු ලැබීමත් සමඟ දිවයින පුරා සියළුම අධිකරණ කලාප ආවරණය වන පරිද්දෙන් පරිවාස සේවය ව්‍යාප්ත කෙරිණ. මෙම සේවාවේ පරිපාලන කටයුතු කරන ලද්දේ බන්ධනාගාර හා පරිවාස දෙපාර්තමේන්තුව විසිනි.

ළමයින් හා යෞවනයන් පිළිබඳ ආඥා පනත ක්‍රියාත්මක කිරීම හා ළමා උසාවි ආරම්භ කිරීමත් සමඟම ළමයින් සඳහා සැපයෙන සේවාවන් එක්තැන් කිරීමේ වැදගත්කම පිළිබඳව සිරිල් හැම්ලීන් මහතාගේ වාර්තාවෙන් පෙන්වා දෙන ලදී. එම නිර්දේශය අනුව 1956 ඔක්තෝම්බර් 01 දින පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව ආරම්භ විය.

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව ආරම්භ වීමෙන් පසු, රැඳවුම් නිවාස, සහතික කළ පාසල්, පරිවාස කාර්යාල ඇතුළු අනෙකුත් ආයතන වල කටයුතු පරිවාස දෙපාර්තමේන්තුව යටතේ ව්‍යාප්ත වූ අතර මුළු දිවයිනම ආවරණය වන පරිදි සහකාර කොමසාරිස්වරුන් ද පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්ට සහායවීම සඳහා පත් කෙරිණි.

1987 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය ක්‍රියාත්මක වීමත් සමඟ එම ව්‍යුහය වෙනස් වූ අතර පරිවාස හා ළමාරක්ෂක සේවය පළාත් සභාවලට විමධ්‍යගත කරන ලදි. ඒ සමඟම මෙතෙක් කොමසාරිස්ට සහාය වීම සඳහා පත්කර සිටි සහකාර කොමසාරිස් තනතුරු ද අහෝසි විය. පළාත් සභා යටතේ පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරුන් සියළු පළාත් වෙනුවෙන් පත් වූ අතර පරිවාස කාර්යාල ඔවුන්ගේ අධීක්ෂණයට යටත් විය.

1991 වර්ෂයේ දී ශ්‍රී ලංකාව ළමා අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශයට අත්සන් තැබූ අතර 1992 වර්ෂයේ දී ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය ප්‍රකාශයට පත් කරන ලදී. එම ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියෙහි වූ ව්‍යවස්ථාවන් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය වෙනුවෙන් 1999 වර්ෂයේ දී දෙපාර්තමේන්තුව විසින් ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් ලෙස සිය ක්ෂේත්‍ර රාජකාරී ඉටුකර ගැනීම අරමුණු කර ගනිමින් නව තනතුරක් නිර්මාණය කර ඊට නිලධාරීන් බඳවා ගන්නා ලදී. මේ වන විට මෙම නිලධාරීන් දිවයින පුරාම පිහිටි දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම්

කාර්යාල වලට අනුයුක්තව කටයුතු කරනු ලබයි. මෙමගින් පරිවාස විෂයය මෙන්ම ළමාරක්ෂක විෂයයටද මූලිකත්වය ලබාදී වැඩසටහන් දියත් කෙරේ.

1956 දී ආරම්භ වූ දෙපාර්තමේන්තුව මුලින්ම සමාජ සේවා අමාත්‍යාංශය යටතට පත්විය. පසුව පත් වූ රජයන් විසින් වරින් වර විවිධ අමාත්‍යාංශ යටතට පත් කරන ලදී. 1990 වසර ආරම්භයේ දී එය ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන හා සමාජ සුභසාධන අමාත්‍යාංශය යටතේ ද, 1994 අගෝස්තු මාසයෙන් පසුව සෞඛ්‍ය, මහා මාර්ග හා සමාජ සේවා අමාත්‍යාංශය යටතේ ද, 2001 වර්ෂයේ දී සමාජ සේවා හා ධීවර ප්‍රජාවගේ නිවාස සංවර්ධන අමාත්‍යාංශය යටතේ ද, 2002 දී සෞඛ්‍ය, පෝෂණ හා සුභසාධන අමාත්‍යාංශය යටතේ ද, 2003 දී සමාජ සුභසාධන අමාත්‍යාංශය යටතේ ද, 2004 වර්ෂයේ දී කාන්තා අභිවෘද්ධි හා සමාජ සුභසාධන අමාත්‍යාංශය යටතේ ද, 2005 වර්ෂයේ සිට ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශය යටතේ ද කටයුතු සිදු කෙරිණි. 2010 වර්ෂයේ සිට ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය යටතේ ද, 2015 වර්ෂයේ සිට කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය යටතේද, 2018 වර්ෂයේ සිට කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යාංශය යටතේද, 2019 වර්ෂයේ සිට කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය යටතේද, 2020 වර්ෂයේ සිට කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය යටතේද, 2022 වසරේ සිට කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය යටතේද, දෙපාර්තමේන්තුවේ කටයුතු සිදු කෙරේ.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

ළමුන්ගේ අයිතීන් තහවුරු වූ ඔවුනට සංවේදී හිතකර සමාජයක්

මෙහෙවර

ජාතික ප්‍රතිපත්තීන් හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව අනාථ, අත්හල හා අසරණ ළමයින් ද, නීතිමය ගැටළුවලට බඳුන් වූ ළමයින් ද, සුවිශේෂී කර ගනිමින් සියළුම ළමයින්ගේ අයිතිවාසිකම් තහවුරු කරමින් ඔවුනට සමාන අවස්ථාවන් උදා කරදීම.

අරමුණු

- නීතිය සමඟ ගැටුම් ඇති කර ගත් දරුවන් පුනරුත්ථාපනය
- අනාථ, අත්හල හා අසරණ දරුවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට ක්‍රියා මාර්ග ගැනීම
- නීතිමය ගැටලු වලට ලක් වූ ළමුන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම
- ළමා අයිතිවාසිකම් ප්‍රවර්ධනය සහ තහවුරු කිරීම සඳහා වූ ක්‍රියාමාර්ග ගැනීම
- අදාල අමාත්‍යාංශ හා පළාත් සභා සම්බන්ධීකරණය කරමින් ඔවුන්ගේ නිර්දේශ මත ළමා අයිතිවාසිකම් සම්බන්ධව දැනට පවතින අණ පනත් ජාතික හා අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි සංශෝධනය කිරීම
- පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු වලට අවශ්‍ය අවස්ථා වලදී තාක්ෂණික දැනුම හා නීති උපදෙස් ලබා දීම
- නීතිය සමඟ ගැටුම් ඇති කර ගත් දරුවන් පුනරුත්ථාපනයට අවශ්‍ය යටිතල පහසුකම් සැලසීම
- පවතින අභ්‍යන්තර වත්කම් කළමනාකරණ ක්‍රමයන් වැඩිදියුණු කිරීම
- ජනතා අවශ්‍යතා තෘප්තිමත් වන ආකාරයෙන් කාර්යක්ෂම සේවාවක් සැපයීම
- කාර්යක්ෂමව ළමා අයිතිවාසිකම් සුරැකීමට හැකි මනා කාර්ය මණ්ඩලයක් පුහුණු කිරීම

1.3 ප්‍රධාන කාර්යයන්

- පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු සමඟ සම්බන්ධීකරණය
- විදේශීය හදාවඩා ගැනීම්
- ළමුන්ගේ අධ්‍යාපන අයිතීන් තහවුරු කිරීම සඳහා වූ වැඩසටහන්
    - අත්වැල, නැණදිරිය, සිප්සවිය, සෙවණ සරණ ආදී අනුග්‍රාහක මාපිය ක්‍රම මඟින් අවශ්‍යතා සහිත ළමයින්ට ශිෂ්‍යාධාර ලබා දීම.
    - කැපකරු දෙගුරු ආධාර ක්‍රමය මඟින් ළමයින්ට අධ්‍යාපන ආධාර ලබා දීම
    - කඩින් කඩ පාසල් යන දරුවන් සහ පාසල් වලින් අතරමඟදී ඇදහැලෙන දරුවන් නැවත පාසල්ගත කිරීම
- ළමා අයිතිවාසිකම් තහවුරු කිරීම වෙනුවෙන් සමාජ ව්‍යුහයන් ස්ථාපිත කිරීම හා බල ගැන්වීම
- ළමුන්ගේ සහභාගිත්ව අයිතිය තහවුරු කිරීම උදෙසා ළමා සමාජ හා ළමා සභා වැඩසටහන ක්‍රියාත්මක කිරීම
- උපදේශනය අවශ්‍ය, නීතිය සමඟ ගැටුම් ඇති කර ගත් දරුවන් වෙනුවෙන් පරත්ත ළමා පුහුණු හා උපදේශන සේවා ජාතික මධ්‍යස්ථානය පවත්වාගෙන යාම

1.4 සංවිධාන සටහන


පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්
නියෝජ්‍ය/ සහකාර කොමසාරිස් (පාලන)
නීති නිලධාරී
නියෝජ්‍ය/ සහකාර කොමසාරිස් (සංවර්ධන)
නියෝජ්‍ය/ සහකාර කොමසාරිස් (පුහුණු පර්. හා ප්‍රකාශන)
නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (සැලසුම්)
සහකාර කොමසාරිස් (නාක්ෂණ)
ගණකාධිකාරී
පරිපාලන නිළධාරී
භාෂා පරිවර්තක
සංඛ්‍යාලේඛණ නිළධාරී
ළමා හිමිකම් ප්‍රවර්ධන නිළධාරී
ළමා හිමිකම් ප්‍රවර්ධන සහකාර/ සංවර්ධන නිළධාරී
ස්ථානභාර නිලධාරී පුහුණු හා පර්යේෂණ මධ්‍ය.
ස්ථානභාර නිළධාරී ජා.ළමා උපදේශන මධ්‍ය.
ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරී
පරිවාස නිලධාරී
ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී
සංවර්ධන නිළධාරී
සංවර්ධන නිළධාරී
මනෝ උපදේශිකා
මූල්‍ය සහකාර
කළමනාකරණ සේවා නිලධාරී
තොරතුරු තාක්ෂණ සහකාර
නොවිධිමත් අධ්‍යාපන උපදේශිකා
සහකාර වෝර්ඩන්
කළමනාකරණ සේවා නිලධාරී
රියදුරු
කාර්යාල කාර්ය සහායක
*ප්‍රාදේශීය ලේකම් හා දිස්ත්‍රික් ලේකම්ට අනුයුක්ත නිලධාරීන් ප්‍රාදේශීය ලේකම් හා දිස්ත්‍රික් ලේකම් මඟින් නියෝජ්‍ය සහකාර කොමසාරිස් (සංවර්ධන) වෙත වාර්තා කරනු ලැබේ.
රියදුරු
අරක්කැමි
කාර්යාල කාර්ය සහායක
මුරකරු
සනීපාරක්ෂක කම්කරු
කාර්යාල කාර්ය සහායක

1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

ශ්‍රී.ලං.ප.සේවයට අයත් නියෝජ්‍ය /සහකාර කොමසාරිස්වරුන් තිදෙනෙකු, දෙපාර්තමේන්තුගත සහකාර කොමසාරිස්වරයෙකු, නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂවරයෙකු (සැලසුම්), ගණකාධිකාරීවරයෙකු, නීති නිලධාරියෙකු, පරිපාලන නිලධාරියෙකු, ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරියෙකු , පරිවාස නිලධාරියෙකු, සහ ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් සිව්දෙනෙකු සමන්විත මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරී මණ්ඩලයකගේ සහාය ඇතිව කොමසාරිස් විසින් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය ඉටු කිරීමේ වගකීම දරනු ලැබේ.

සංවිධාන ව්‍යුහයට අයත් වන අංශ:-

1. ආයතන හා පරිපාලන අංශය
2. ගිණුම් අංශය
3. පරිවාස අංශය
4. සංවර්ධන අංශය
5. සැලසුම් අංශය
6. පරත්ත ළමා පුහුණු හා උපදේශන සේවා ජාතික මධ්‍යස්ථානය

1.6 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

(අ)	**ව්‍යාපෘතියේ නම**	**: ළමුන්ගේ ආරක්ෂාව සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම**
(ආ)	දායක නියෝජිතායතනය	: සේව් ද චිල්ඩ්‍රන් ආයතනය
(ඇ)	ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම	: රු.මි. 1.8652
(ඈ)	ව්‍යාපෘති කාල සීමාව	: අවුරුදු 4

(අ)	**ව්‍යාපෘතියේ නම**	**: යුනිසෙෆ් වැඩ සැලැස්ම**
(ආ)	නියෝජිත ආයතනය	: යුනිසෙෆ්
(ඇ)	ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම	: රු. මි. 10.684
(ඈ)	ව්‍යාපෘති කාලසීමාව	: අවුරුදු 1

02
ප්‍රගතිය හා ඉදිරි දැක්ම

පරිවාස හා ළමාරක්ෂක සේවාදෙපාර්තමේන්තුව

ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය - 2022

වැය ශීර්ෂය (A)	ව්‍යාපෘතියේ නම (B)	භෞතික කටයුතු ආරම්භ කල දිනය	අපේක්ෂිත වැඩ නිම කිරීමේ දිනය	ව්‍යපෘති නිමැවුම	ප්‍රධාන කාර්ය සාධන දර්ශකය	මුළු පිරිවැය ඇස්තමේන්තුව (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය (%)	භෞතික ඉලක්කය	භෞතික ප්‍රගතිය	භෞතික ප්‍රගතිය (%)
217-2-2-3-2202	ළමා නිවාස අධීක්ෂණය තුලින් හඳුනා ගන්නා අවශ්‍යතා සඳහා සහ අවම ප්‍රමිතින් පවත්වා ගෙන යාම සඳහා මූල්‍ය සහයන් ලබා දීම	01.01.2022	31.12.2022	ළමා නිවාස 3	ප්‍රතිසංස්කරණය කරන ලද ළමා නිවාස ගණන	4.750	4.316	90	ළමා නිවාස 3	ළමා නිවාස 7	100
	එකතුව					**4.750**	**4.316**				
217-2-2-4-2202	පළාත් ළමා සංවර්ධන මධ්‍යස්ථාන වල භෞතික සම්පත් අඩුපාඩු ලබා දීම	01.01.2022	31.12.2022	මධ්‍යස්ථාන 6	මධ්‍යස්ථාන සංඛ්‍යාව	1.922	1.9080	99	මධ්‍යස්ථාන 6	මධ්‍යස්ථාන 6	100
	හඳුනාගත් දරුවන් නැවත සමාජගත කිරීම	01.01.2022	31.12.2022	දරුවන් 5	සමාජ ගත කල දරුවන් සංඛ්‍යාව	2.003	1.761	88	දරුවන් 5	දරුවන් 5	100
	දරුවන් රැකබලා ගන්නා නිලධාරීන් පුහුණු කිරීම	01.01.2022	31.12.2022	වැඩසටහන් 2	පුහුණු වැඩසටහන් සංඛ්‍යාව	0.335	0.335	100	වැඩසටහන් 2	වැඩසටහන් 2	100
	පළාත් පරිවාස දෙපාර්තමේන්තු සම්බන්ධීකරණය	01.01.2022	31.12.2022	රැස්වීම් 7	රැස්වීම් සංඛ්‍යාව	0.1515	0.1522	100	රැස්වීම් 7	රැස්වීම් 7	100
	පරිවාස නිලධාරින් සඳහා මිනිස් ජාවාරම වැලැක්වීම හා	01.01.2022	31.12.2022	වැඩසටහන් 3	වැඩසටහන් සංඛ්‍යාව	0.1135	0.1090	96	වැඩසටහන් 3	වැඩසටහන් 3	100

	නීති පිළිබඳව ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.										
	අයවැය වක්‍රලේඛ අංක 03/2022 අනුව අවලංගු කරන ලද ව්‍යාපෘති	01.01.2022	31.12.2022			0.475					
	එකතුව					**5.000**	**4.2652**				
217-2-2-5-2202	යහපත් දෙමාපියභාවය සහ දරුවන් හික්මවීමේ යහපත් ක්‍රමවේද පිළිබඳව දෙමාපියන්ගේ කුසලතා ඔප්නැංවීමේ වැඩසටහන්	01.01.2022	31.12.2022	වැඩසටහන් 1	වැඩසටහන් සංඛ්‍යාව	0.185	0.1330	72	වැඩසටහන් 1	වැඩසටහන් 1	100
	අගය කළ යුතු දරුවකු වන්නේ කෙසේද යන්න පිළිබඳව දරුවන්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන්	01.01.2022	31.12.2022	වැඩසටහන් 335	වැඩසටහන් සංඛ්‍යාව	1.670	1.6198	97	වැඩසටහන් 335	වැඩසටහන් 327	98
	අවදානම් සහගත තත්ත්වයේ පසුවන දරුවන් සිටින පවුල් සඳහා ආරක්ෂණ සැලසුම් තුලින් මූල්‍ය සහ මූල්‍ය නොවන සහයන් සැලසීම	01.01.2022	31.12.2022	ආරක්ෂණ සැලසුම් 275	ආරක්ෂණ සැලසුම් සංඛ්‍යාව /ප්‍රතිලාභී දරුවන් ගණන	8.344	8.0899	97	ආරක්ෂණ සැලසුම් 275	ආරක්ෂණසැලසුම් 208	75
	සිද්ධි කළමණාකරණ මාර්ගෝපදේශය පිලිබඳව ළ.හි.ප්‍ර.නි. පුහුණු	01.01.2022	31.12.2022	වැඩසටහන් 4	වැඩසටහන් සංඛ්‍යාව	0.200	0.196	98	වැඩසටහන් 4	වැඩසටහන් 4	100

	කිරීම										
	ආයතනගත දරුවන් (පරත්ත) සඳහා පුහුණු වීම්/ කුසලතා සංවර්ධන /ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම	01.01.2022	31.12.2022	වැඩසටහන් 1	වැඩසටහන් සංඛ්‍යාව	0.008	0.008	100	වැඩසටහන් 1	වැඩසටහන් 1	100
	ළමා මූලික පර්යේෂණ වල යෝජිත නිර්දේශ ක්‍රියාත්මක කිරීම	01.01.2022	31.12.2022	වැඩසටහන් 3	වැඩසටහන් සංඛ්‍යාව	0.095	0.000	0	වැඩසටහන් 3	වැඩසටහන් 0	0
	ළමා සමාජ සහ ළමා සභා රැස්වීම් පැවැත්වීම (ප්‍රා. ලේ මට්ටමින්)	01.01.2022	31.12.2022	රැස්වීම් 670	රැස්වීම් සංඛ්‍යාව	2.010	1.8803	93	රැස්වීම් 670	රැස්වීම් 639	95
	ළමා සමාජ සහ ළමා සභා රැස්වීම්පැවැත්වීම (දිස්ත්‍රික් මට්ටමින්)	01.01.2022	31.12.2022	රැස්වීම් 50	රැස්වීම් සංඛ්‍යාව	0.250	0.1931	77	රැස්වීම් 50	රැස්වීම් 43	86
	ජාතික ළමා සභාව පැවැත්වීම (ජාතික මට්ටමින්)	01.01.2022	31.12.2022	රැස්වීම් 1	රැස්වීම් සංඛ්‍යාව	0.030	0.0138	46	රැස්වීම් 1	රැස්වීම් 1	100
	ළමා අයිතිවාසිකම් පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටු රැස්වීම් පැවැත්වීම	01.01.2022	31.12.2022	රැස්වීම් 2	රැස්වීම් සංඛ්‍යාව	0.025	0.000	0	රැස්වීම් 2	රැස්වීම් 1	50
	ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රාදේශීය මෙහෙයුම් කමිටු රැස්වීම් පැවැත්වීම	01.01.2022	31.12.2022	රැස්වීම් 1340	රැස්වීම් සංඛ්‍යාව	3.249	2.9432	90	රැස්වීම් 1340	රැස්වීම් 1249	93
	ග්‍රාමීය කමිටු සමාජිකයන් පුහුණුකිරීමට, පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන්	01.01.2022	31.12.2022	වැඩසටහන් 2	වැඩසටහන් සංඛ්‍යාව	0.041	0.0360	88	වැඩසටහන් 2	වැඩසටහන් 2	100

	ළමා අයිතිවාසිකම් පිළිබඳ පළාත් මෙහෙයුම් කමිටු රැස්වීම් පැවැත්වීම	01.01.2022	31.12.2022	රැස්වීම් 14	රැස්වීම් සංඛ්‍යාව	0.131	0.1152	88	රැස්වීම් 14	රැස්වීම් 7	50
	ආදර්ශ ගම්මාන සඳහා වැඩසටහන් පැවැත්වීම	01.01.2022	31.12.2022	වැඩසටහන් 1	වැඩසටහන් සංඛ්‍යාව	0.000	0.000	0	වැඩසටහන් 1	වැඩසටහන් 1	100
	ආන්තික ප්‍රජාවගේ දරුවන් සඳහා ජංගම සේවා පැවැත්වීම හා නෛතික ලියකියවිලි ලබා දීම	01.01.2022	31.12.2022	වැඩසටහන් 16	වැඩසටහන් සංඛ්‍යාව	0.696500	0.6302	90	වැඩසටහන් 16	වැඩසටහන් 14	88
	අවදානමට ලක්විය හැකි දරුවන්ගේ සංවර්ධනය සහ පැවැත්මේ අයිතීන් සහතික කිරීම සඳහා සහාය වීම	01.01.2022	31.12.2022	වැඩසටහන් 6	වැඩසටහන් සංඛ්‍යාව	0.6350	0.6350	100	වැඩසටහන් 6	වැඩසටහන් 6	100
	ළ.හි.ප්‍ර.නි. ගේ වාර්ෂික සංස්කරණ සම්මේලනය සහ අත්දැකීම් හුවමාරු කිරීමේ අවස්ථාව සැලසීම	01.01.2022	31.12.2022	වැඩසටහන් 1	වැඩසටහන් සංඛ්‍යාව	0.380	0.000	0	වැඩසටහන් 1	වැඩසටහන් 0	0
	ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම (ජාතික/ දිස්ත්‍රික්)	01.01.2022	31.12.2022	රැස්වීම් 227	රැස්වීම් සංඛ්‍යාව	1.249580	0.9521	76	රැස්වීම් 227	රැස්වීම් 213	93
	පවත්නා යාන්ත්‍රණය තුළින් (රාජකාරී දින පොත) නිලධාරීන්ගේ කාර්ය සාධනය අඛණ්ඩව අධීක්ෂණය කිරීම	01.01.2022	31.12.2022	රාජකාරී දින පොත් 450	රාජකාරී දින පොත් සංඛ්‍යාව	0.567	0.5661	99	රාජකාරී දින පොත් 450	රාජකාරී දින පොත් 450	100

	ලෝක ළමා දින වැඩසටහන්	01.01.2022	31.12.2022	වැඩසටහන් 363	වැඩසටහන් සංඛ්‍යාව	1.4868	1.3426	90	වැඩසටහන් 363	වැඩසටහන් 348	95
	මුද්‍රණ කටයුතු සහ ප්‍රකාශන	01.01.2022	31.12.2022	ප්‍රකාශන 2	ප්‍රකාශන සංඛ්‍යාව	0.150	0.1070	71	ප්‍රකාශන 2	ප්‍රකාශන 2	100
	ආධාර වැඩසටහන් වල ප්‍රතිලාභීන් පසුවිපරම	01.01.2022	31.12.2022	රැස්වීම් 1	රැස්වීම් සංඛ්‍යාව	0.020	0.0062	31	රැස්වීම් 1	රැස්වීම් 1	100
	අන්තර්ජාලය තුළ දරුවන්ගේ සුරක්ෂිතභාවය පිළිබඳව අත්පත්‍රිකා මුද්‍රණය	01.01.2022	31.12.2022	1(24,000 අත්පත්‍රිකා)	අත්පත්‍රිකා සංඛ්‍යාව	0.105	0.1050	100	1(24,000 අත්පත්‍රිකා)	1(24,000 අත්පත්‍රිකා)	100
	විශේෂ ව්‍යාපෘති	01.01.2022	31.12.2022	ව්‍යාපෘති 1	ව්‍යාපෘති සංඛ්‍යාව	0.017	0.0170	100	ව්‍යාපෘති 1	ව්‍යාපෘති 1	100
	අතැති බිල්පත්	01.01.2022	31.12.2022			0.4551	0.4533	99			
	එකතුව					**22.0000**	**20.0428**				
217-2-2-6-2202	කඩින් කඩ පාසැල් යන හා පාසැල් හැරයාමේ අවදානමක් සහිත දරුවන් සඳහා අධ්‍යාපනික ආධාර ලබා දීම	01.01.2022	31.12.2022	දරුවන් 2023	දරුවන් සංඛ්‍යාව	2.0785	2.0595	99	දරුවන් 2023	දරුවන් 2021	100
	කැපකරු දෙගුරු ශිෂ්‍යාධාර වැඩසටහන	01.01.2022	31.12.2022	දරුවන් 2000	දරුවන් සංඛ්‍යාව	16.800	16.6980	99	දරුවන් 2000	දරුවන් 2000	100
	වෛද්‍ය හා පෝෂණ ආධාර ලබාදීම	01.01.2022	31.12.2022	දරුවන් 561	දරුවන් සංඛ්‍යාව	2.8785	2.7830	96	දරුවන් 561	දරුවන් 503	90
	නිවුන් දරු ආධාර වැඩසටහන	01.01.2022	31.12.2022	පවුල් 142	පවුල් සංඛ්‍යාව	1.0985	1.0515	95	පවුල් 142	පවුල් 135	95
	ගංවතුරින් අසරණ වූ දරුවන් සඳහා ආධාර ලබා දීම	01.01.2022	31.12.2022	දරුවන් 20	දරුවන් සංඛ්‍යාව	0.458	0.4520	98	දරුවන් 20	දරුවන් 19	95
	සෙනෙහස ආධාර (සුනාමියෙන් අසරණ වූ දරුවන්	01.01.2022	31.12.2022	දරුවන් 4	දරුවන් සංඛ්‍යාව	0.039	0.0390	100	දරුවන් 4	දරුවන් 4	100

	සඳහා)										
	සුරක්ෂිත අන්තර්ජාල භාවිතය පිළිබඳව දරුවන් දැනුවත් කිරීම	01.01.2022	31.12.2022	වැඩසටහන් 162	වැඩසටහන් සංඛ්‍යාව	0.648	0.5960	92	වැඩසටහන් 162	වැඩසටහන් 173	106
	පීඩාවට පත් ළමුන් සඳහා හදිසි ආධාර ලබා දීම	01.01.2022	31.12.2022	දරුවන් 112	දරුවන් සංඛ්‍යාව	0.5655	0.5560	98	දරුවන් 112	දරුවන් 112	100
	ආරක්ෂණ සැලසුම් ප්‍රතිලාභීන් පිලිබඳව පසුවිපරම් සිදු කිරීම	01.01.2022	31.12.2022	වැඩසටහන් 1	වැඩසටහන් සංඛ්‍යාව	0.0383	0.0382	99	වැඩසටහන් 1	වැඩසටහන් 1	100
	මූල්‍ය දුෂ්කරතා ඇති ළමුන් සඳහා පාසල් උපකරණ ලබාදීම සඳහා සම්පත් සංචිතයක් පිහිටුවීම.	01.01.2022	31.12.2022	සම්පත් සංචිත 10	සම්පත් සංචිත සංඛ්‍යාව	0.7955	0.7937	99	සම්පත් සංචිත 10	සම්පත් සංචිත 10	100
	අතැති බිල්පත්	01.01.2022	31.12.2022			0.6002	0.6000	99			
	එකතුව					**26.0000**	**25.6668**				
ළමුන් සඳහා වන සමාජ ආරක්ෂණ ව්‍යාපෘතිය (SAVE) - 403-2-4-6-2509-13 / 171-2-08-006-(2509)13	අවදානම් සහගත තත්ත්වයේ පසුවන දරුවන් සිටින පවුල් සඳහා ආරක්ෂණ සැලසුම් තුලින් මූල්‍ය සහ මූල්‍ය නොවන සහයන් සැලසීම	01.01.2022	31.12.2022	ආරක්ෂණ සැලසුම් 15	ආරක්ෂණ සැලසුම් සංඛ්‍යාව /ප්‍රතිලාභී දරුවන් ගණන	0.533	0.533	100	ආරක්ෂණ සැලසුම් 15	ආරක්ෂණ සැලසුම් 15	100
	නිවුන් දරු ආධාර වැඩසටහන	01.01.2022	31.12.2022	පවුල් 60	පවුල් සංඛ්‍යාව	0.4875	0.4200	86	පවුල් 60	පවුල් 53	88

	ආර්ථික අපහසුතා ඇති ළමුන් සඳහා පාසල් උපකරණ ලබාදීම සඳහා සම්පත් සංචිතයක් පිහිටුවීම	01.01.2022	31.12.2022	දිස්ත්‍රික් 25	සම්පත් සංචිත සංඛ්‍යාව	0.506	0.424	83	දිස්ත්‍රික් 25	දිස්ත්‍රික් 21	84
	අතැති බිල්පත්	01.01.2022	31.12.2022	දිස්ත්‍රික් 4	දිස්ත්‍රික් සඛ්‍යාව	0.4882	0.4882	100	දිස්ත්‍රික් 4	දිස්ත්‍රික් 4	100
	එකතුව					**2.0150**	**1.8652**				
යුනිසෙෆ් (UNICEF) - 171-2-08-12-2202-03/13	බරපතල අවදානම් සහගත ළමුන් සඳහා ආධාර ලබා දීම	01.01.2022	31.12.2022	දරුවන් 1795	දරුවන් සංඛ්‍යාව	8.9760	7.585	84	දරුවන් 1795	දරුවන් 1517	84
	අවදානම් සහගත දරුවන් සඳහා ආරක්ෂණ සැලසුම් ක්‍රියාත්මක කිරීම	01.01.2022	31.12.2022	ආරක්ෂණ සැලසුම් 3	ආරක්ෂණ සැලසුම් සංඛ්‍යාව/ ප්‍රතිලාභී දරුවන් ගණන	0.2103	0.2103	100	ආරක්ෂණ සැලසුම් 3	ආරක්ෂණ සැලසුම් 3	100
	සුළු වැරදිවලට වරදකරුවන් වන ළමුන් යුක්තිය පසඳලීමේ අධිකරණ ක්‍රියාවලියෙන් දුරස්කර තැබීම (Diversion) සහ පවුල් පාදක රැකවරණය ශක්තිමත් කිරීම	01.01.2022	31.12.2022	වැඩසටහන් 7	වැඩසටහන් සංඛ්‍යාව	1.4511	1.4511	100	වැඩසටහන් 7	වැඩසටහන් 7	100
	ආයතනගත දරුවන් පිලිබඳ සංගණන වාර්තාවේ දම්ළ පරිවර්තනය	01.01.2022	31.12.2022	පරිවර්තන 1	පරිවර්තන සංඛ්‍යාව	0.1319	0.1319	100	පරිවර්තන 1	පරිවර්තන 1	100
	ළමා නිවාස කාර්ය මණ්ඩල පුහුණුව - දකුණු පළාත	01.01.2022	31.12.2022	වැඩසටහන් 1	වැඩසටහන් සංඛ්‍යාව	0.1113	0.1113	100	වැඩසටහන් 1	වැඩසටහන් 1	100

	අත්වැල - අනුග්‍රාහක කැපකරු මාපිය ක්‍රමය	01.01.2022	31.12.2022	වැඩසටහන් 1	වැඩසටහන් සංඛ්‍යාව	1.195	1.195	100	වැඩසටහන් 1	වැඩසටහන් 1	100
	එකතුව					**12.076**	**10.6846**				

03

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසිඒ-එෆ්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

අයවැය 2022 රු.		සටහන	තත්‍ය 2022 රු.	- 2,021 රු.	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	**1**	-	-	ඒසිඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	**2**	-	-	
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	**3**	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	**4**	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		355,224,000	323,268,000	**ඒසිඒ-3**
-	තැන්පතු		1,015,398	1,592,875	**ඒසිඒ-4**
-	අත්තිකාරම් ගිණුම්		13,488,176	13,386,895	**ඒසිඒ-5**
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**369,727,574**	338,247,770	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**369,727,574**	338,247,770	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)		900,805	2,972,646	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		368,826,769	335,275,124	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	
329,140,000	වැටුප්, වේතනසහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	**5**	326,818,697	295,670,326	
38,310,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	**6**	36,115,062	34,166,182	**ඒසිඒ-2(ii)**
3,290,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	**7**	2,943,077	4,033,241	
-	පොළී ගෙවීම්	**8**	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	**9**	-	-	
370,740,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**365,876,836**	333,869,749	

	මූලධන වියදම්				
300,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	126,980	163,165	
2,700,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	2,392,756	2,631,358	
57,750,000	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	56,315,676	63,019,079	**ඒසිඒ-2(ii)**
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**	-	-	
400,000	හැකියා වර්ධනය	**14**	399,393	1,398,624	
-	වෙනත් මූලධන වියදම්	**15**	-	-	
61,150,000	**මුළු මූලධන වියදම් (උ)**		**59,234,805**	67,212,226	
	තැන්පතු ගෙවීම්		1,216,812	1,361,924	**ඒසිඒ-4**
	අත්තිකාරම් ගෙවීම්		12,122,037	12,365,939	**ඒසිඒ-5**
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		13,338,849	13,727,863	
431,890,000	**මුළු වියදම් එ = (ඊ+උ+ඌ)**		438,450,490	414,809,838	
-	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		(69,623,721)	(79,534,714)	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(69,623,721)	(79,534,714)	**ඒසිඒ-7**
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	**ඒසිඒ-3**
			(69,623,721)	(79,534,714)	

3.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය 2022 රු.	2021 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	81,847,822	81,571,822
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	34,131,057	35,497,196
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**115,978,879**	**117,069,018**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		34,049,757	35,214,482
දේපළ පිරියත හා උපකරණ සංචිතය		81,847,822	81,571,822
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	81,300	282,714
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**115,978,879**	**117,069,018**

පිටු අංක 09 සිට 39 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 40 සිට 73 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර :	තනතුර :	නම :
දිනය : 2023/2/24	දිනය : 2023.02.21	දිනය ; 2023.02.21

යමුනා පෙරේරා
ලේකම්
[illegible], ළමා කටයුතු හා [illegible] සවිබලගැන්වීම අමාත්‍යාංශය
[illegible] මහල, සෙත්සිරිපාය - අදියර II බත්තරමුල්ල.

නාමල් ලියනගේ
කොමසාරිස්
පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව
තුන්වන මහල, සෙත්සිරිපාය, අදියර II
බත්තරමුල්ල.

ආර්. ඒ. ජේ. දිල්රුක්ෂි
ගණකාධිකාරි
පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව
03 වන මහල, සෙත්සිරිපාය II වන අදියර,
බත්තරමුල්ල.

3

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තත්‍ය	
	2022 රු.	**2021** රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		-
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	17,882,080	21,523,051
අග්‍රිම ලැබීම්	355,224,000	323,268,000
අත්තිකාරම් අයකර ගැනීම්	12,455,315	11,824,086
තැන්පතු ලැබීම්	1,015,398	1,592,875
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**386,576,793**	**358,208,012**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	352,166,204	320,335,710
සහනාධාර සහ මාරු කිරීම්	2,943,077	4,033,241
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	6,872,989	205,722
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	900,805	2,972,646
අත්තිකාරම් ගෙවීම්	11,351,321	11,368,390
තැන්පතු ගෙවීම්	1,216,812	1,361,924
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**375,451,208**	**340,277,633**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**11,125,585**	**17,930,379**

ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	11,125,585	17,930,379
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**11,125,585**	**17,930,379**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(11,125,585)**	**(17,930,379)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	**-**	**-**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**-**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**-**	**-**

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තා කිරීමේ පදනම

1) වාර්තාකරණ කාල පරිච්ඡේදය

2022 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාල පරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාල පරිච්ඡේදය වේ.

2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.
මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල් වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාල පරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.
දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ

2022 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව එම තොරතුරු මූල්‍ය ප්‍රකාශවල අදාළ පරිදි ඇතුළත් කර ගත හැක. එසේම "වාර්තාකරණ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

3.5 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	370,740,000	370,740,000	365,876,836	99%
ප්‍රාග්ධන	61,150,000	63,175,000	59,234,805	94%

3.6 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

3.6-1 දිස්ත්‍රික්ක

217-2-2-52202, 217-2-2-6-2202

Rs. ,000

අනු අංකය	ප්‍රතිපාදන වෙන් කිරීම ලැබෙන්නේ අමාත්‍යාංශයෙන්/ දෙපාර්තමේන්තුවෙන්ද	ප්‍රතිපාදන වෙන් කිරීමේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	අවසාන ප්‍රතිපාදන ප්‍රතිශතක් ලෙස ප්‍රතිපාදන භාවිතය
			ආරම්භය	අවසානය		
1	කොළඹ	අවාසි සහගත තත්ත්වයේ සිටින දරුවන්ගේ අයිතිවාසිකම් තහවුරු කිරීම සහ වෘත්තීය නිපුණතා සහ මූල්‍යාධාර ලබා දීම තුලින් ඔවුන් සවිබල ගැන්වීම	2,045,983.00	2,045,983.00	1,963,985.55	95.99
2	ගම්පහ		2,485,550.00	2,485,550.00	2,485,390.00	99.99
3	කළුතර		2,012,400.00	2,012,400.00	1,970,340.00	97.90
4	ගාල්ල		2,805,290.00	2,805,290.00	2,769,566.72	98.72
5	මාතර		2,608,900.00	2,608,900.00	2,518,659.40	96.54
6	හම්බන්තොට		2,526,979.00	2,526,979.00	2,430,062.32	96.16
7	අනුරාධපුර		2,165,800.00	2,165,800.00	2,117,144.80	97.73
8	පොලොන්නරුව		772,500.00	772,500.00	711,010.50	92.04
9	කුරුණෑගල		5,217,400.00	5,217,400.00	5,110,571.91	97.95
10	පුත්තලම		1,152,400.00	1,152,400.00	1,114,813.50	96.73
11	මහනුවර		4,013,552.00	4,013,552.00	3,987,284.75	99.34
12	මාතලේ		1,438,041.28	1,438,041.28	1,374,218.70	95.56
13	නුවරඑළිය		1,324,700.00	1,324,700.00	1,300,661.00	98.18
14	රත්නපුර		2,633,430.28	2,633,430.28	2,601,925.13	98.80
15	කෑගල්ල		1,882,245.00	1,882,245.00	1,855,607.00	98.58
16	මොනරාගල		1,673,800.00	1,673,800.00	1,650,788.00	98.62
17	බදුල්ල		2,249,500.00	2,249,500.00	2,012,283.00	89.45
18	යාපනය		925,500.00	925,500.00	919,350.00	99.33
19	වවුනියාව		267,100.00	267,100.00	226,550.00	84.81
20	මන්නාරම		342,795.50	342,795.50	342,795.50	100
21	මුලතිවු		223,600.00	223,600.00	183,980.00	82.28
22	කිලිනොච්චි		416,500.00	416,500.00	399,438.00	95.90
23	අම්පාර		1,980,600.00	1,980,600.00	1,941,290.00	98.01
24	මඩකලපුව		1,014,700.00	1,014,700.00	961,610.00	94.76
25	ත්‍රිකුණාමලය		577,000.00	577,000.00	510,119.00	88.40
	එකතුව		**44,756,266.06**	**44,756,266.06**	**43,459,444.78**	**97.10**

3.6 – 2 පළාත් සභා

217-2-2-3-2202, 217-2-2-4-2202, 217-2-2-5-2202

	ප්‍රතිපාදන වෙන්කිරීම ලැබෙන්නේ කුමන අමාත්‍යාංශයෙන් / දෙපාර්තමේන්තුවෙන්ද?	ප්‍රතිපාදන වෙන් කිරීමේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	අවසාන ප්‍රතිපාදන ප්‍රතිශතයක් ලෙස ප්‍රතිපාදන භාවිතය
			ආරම්භය	අවසානය		
1	මධ්‍යම	ළමා නිවාස අධීක්ෂණය තුලින් හඳුනා ගන්නා අවශ්‍යතා සඳහා සහ අවම ප්‍රමිතීන් පවත්වා ගෙන යාම සඳහා මූල්‍ය සහයන් ලබා දීම, පළාත් ළමා සංවර්ධන මධ්‍යස්ථාන වල භෞතික සම්පත් අඩුපාඩු ලබා දීම, හඳුනාගත් දරුවන් නැවත සමාජගත කිරීම, දරුවන් රැකබලා ගන්නා නිලධාරීන් පුහුණු කිරීම, පළාත් පරිවාස දෙපාර්තමේන්තු සම්බන්ධීකරණය , පරිවාස නිලධාරීන් සඳහා මිනිස් ජාවාරම වැලැක්වීම හා නීති පිළිබඳව ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.	520,672.50	520,672.50	520,672.50	100
2	වයඹ		530,000.00	530,000.00	530,000.00	100
3	සබරගමුව		361,990.00	361,990.00	361,990.00	100
4	උතුරුමැද		1,399,500.00	1,399,500.00	1,399,500.00	100
5	දකුණ		2,731,301.15	2,731,301.15	2,721,114.80	100
6	උතුර					100
7	නැගෙනහිර					100
8	බස්නාහිර		2,856,200.20	2,856,200.20	2,842,200.20	100
9	ඌව					100
10	ප්‍රධාන (පළාත් පරිවාස දෙපාර්තමේන්තු සම්බන්ධීකරණය, පරිවාස නිලධාරීන් සඳහා මිනිස් ජාවාරම වැලැක්වීම හා නීති පිළිබඳව ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.)		206,252.00	206,252.00	206,252.00	100
11	පළාත් කොමසාරිස් රැස්වීම්		115,225.00	115,225.00	115,225.00	100
	එකතුව		**8,721,140.85**	**8,721,140.85**	**8,696,954.50**	100

3.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම් කේතය	*කේත විස්තරය*	**2022.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව ශේෂය**	**2022.12.31 දිනට මූල්‍ය තත්ව වාර්තාව අනුව ශේෂය**	**ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත**	**ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම**
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	32,345,000	32,345,000		100%
9152	යන්ත්‍රෝපකරණ	46,847,822	46,847,822		100%
9153	ඉඩම්	2,655,000	2,655,000		100%
9154	අස්පෘශ්‍ය වත්කම්				
9155	ජීව විද්‍යාත්මක වත්කම්				
9160	කෙරීගෙන යන වැඩ				
9180	බදු දෙන ලද වත්කම්				

3.8 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. VOT/B/DPCC/02/2022/06 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2023 මැයි 30 දින

ගණන්දීමේ නිලධාරී

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව,

ශීර්ෂය - 217 පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය - 217 පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන් දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේ දී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේ දී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

1

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශනය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල

සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6 මූල්‍ය නොවන වත්කම්

උපදේශන ගාස්තුද ඇතුලත්ව රු. 2,350,000ක පිරිවැයක් දරා එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමේදී කාලීන හා නිවැරදි වාර්තා ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය සඳහා 2018 වර්ෂයේදී දෙපාර්තමේන්තුව වෙත පවරන ලද UNCRC දත්ත පද්ධතිය මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා නොතිබුණි.මෙම දත්ත පද්ධතිය ක්‍රියාත්මක නොකොට නිෂ්කාර්යව පැවතුණි.

2. මෙහෙයුම් සමාලෝචනය

2.1. කාර්යසාධනය

2.1.1 කාර්යභාරය ඉටු නොකිරීම

දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් අතරට ගැනෙන ළමා මූලික පර්යේෂණ පැවැත්වීම වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මට අනුව වසර තුළ ළමා මූලික පර්යේෂණ 03ක් සිදු කිරීමටසැලසුම් කර රු. 95,000ක ප්‍රතිපාදන වෙන් කර තිබුණද වසර තුල ළමා මූලික පර්යේෂණ කිසිවක් සිදුකර නොතිබුණි. දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යයන් කෙරෙහි අවධානයන් යොමු වී නොමැති බව එහිදී නිරීක්ෂණය විය.

2.1.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

(අ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමෙන් ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම හා ළමුන්ට සුදුසු පරිසරයක් නිර්මාණය කිරීම සඳහා ප්‍රාදේශීය මෙහෙයුම් කමිටු ව්‍යුහය සක්‍රිය ලෙස පවත්වාගෙන යෑමේ අරමුණෙන් සමාලෝචිත වර්ෂයේ දිස්ත්‍රික්ක 25 ක ග්‍රාම නිලධාරී වසම් 335 ක් සඳහා රු.3,249,000ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. එක් ග්‍රාම නිලධාරී වසමකින් එක් කාර්තුවකට එක් ප්‍රාදේශීය මෙහෙයුම් කමිටුවක් බැගින් වසර තුල කමිටු 1340 ක් පැවැත්වීමට ඉලක්ක කර තිබුණද, අදාල ලිපි ගොනු පරීක්ෂාවේදී කමිටු 405ක් පමණක් පවත්වා තිබුණි. වසර තුළ පැවැත්වීමට ඉලක්ක කල කමිටු සංඛ්‍යාවෙන්, කමිටු රැස්වීම් පැවැත්වීමේ ප්‍රගතිය 30% ක් බව නිරීක්ෂණය වූ අතර ඒ සඳහා දරා ඇති වියදම 3,080,000 ක්වූ අතර එය වෙන් කල ප්‍රතිපාදනයෙන් 95% විය.

(ආ) ඉදිරිපත් කල ළමා මෙහෙයුම් කමිටු පැවැත්වීමේ ලිපිගොනු හා ප්‍රගති වාර්තා අනුව මෙහෙයුම් කමිටු පැවැත්වූ බවට සනාථ නොවන කමිටු රැස්වීම් ගණන 935වූ අතර. එය 70%ක ඉහළ ප්‍රතිශතයක් ගෙන තිබුණි.

(ඇ) 2022 අනුමත ක්‍රියාකාරී සැලැස්ම අනුව නිවුන් දරු ආධාර ලබා දීම සඳහා පවුල් ඒකක 142 ක් ඉලක්ක කර ගනිමින් රු. 1,098,500ක ප්‍රතිපාදන වෙන්කර තිබූ අතර වසර තුළ රු. 1,076,000 වැය කර 98 % ක ප්‍රගතියක් ලබා ඇති බව දක්වා තිබුණද විගණනයට ඉදිරිපත් වූ ලිපිගොනු අනුව ආධාර මුදල් ලබා ගත් බවට සනාථ කෙරෙන පවුල් ඒකක

ගණන වනුයේ පවුල් 86 ක් පමණි. ඒ අනුව අපේක්ෂිත ආධාරලාභී පවුල් ඒකක 142 කින් පවුල් ඒකක 86 ක් සඳහා ආධාර මුදල් ලබා දී තිබුණි. ප්‍රගතිය 61% වූ අතර ආධාර මුදල් ලබා ගත් බවට ලදුපත් ඉදිරිපත් නොකරනලද පවුල් ඒකක සංඛ්‍යාව 56 කි.

2.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය අනුව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමග වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.

2.3 වත්කම් කළමනාකරණය

ගොරකාන, ගල්කණුව පාරේ පිහිටි දෙපාර්තමේන්තුවට අයත් ගොඩනැගිලි කිහිපයක් ප්‍රයෝජනයට නොගෙන නිශ්කාර්යව පැවතුණි.

3. මානව සම්පත් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ නීති නිලධාරි තනතුර 2014 අගෝස්තු මාසයේ සිට පුරප්පාඩුව පැවතුණි.

ඩබ්ලිව්. ආනන්ද
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත - ලේකම්, කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යාංශය
අධ්‍යක්ෂ ජනරාල්,රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

04

කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

වැය ශීර්ෂ අංකය	නිශ්චිත දර්ශකය	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස සත්‍ය ප්‍රතිදානය		
		100% - 90%	**75% - 89%**	**50% - 74%**
217 -2 -2 – 3 – 2202	ප්‍රතිසංස්කරණය කළ ළමා නිවාස සංඛ්‍යාව	√		
217 – 2 – 2- 4 – 2202	අධීක්ෂණය කළ ළමා නිවාස සංඛ්‍යාව	√		
	ආයතනගත දරුවන් රැකබලා ගන්නන් සඳහා පැවැත්වූ පුහුණු වැඩසටහන් සංඛ්‍යාව	√		
	සමාජගත කළ හදුනාගත් දරුවන් සංඛ්‍යාව	√		
217 – 2 – 2- 5 - 2202	සංවර්ධනය සඳහා සකස් කළ ආරක්ෂණ සැලසුම් සංඛ්‍යාව		√	
	පැවැත්වූ රැස්වීම් සංඛ්‍යාව	√		
	පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව	√		
	පැවැත්වූ කමිටු සංඛ්‍යාව	√		
	ලබා දුන් අධ්‍යාපනික තාක්ෂණික මෙවලම් ප්‍රමාණය	√		
	විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය	√		
217-02-02-06-2202	ප්‍රතිලාභ ලැබූ දරුවන් සංඛ්‍යාව	√		
	පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව	√		
	පැවැත්වූ කමිටු සංඛ්‍යාව	√		

05

තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ වැඩසටහන	ඉලක්කය /අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
				0% - 49%	50% - 74%	75% - 100%
වෛද්‍ය ආධාර ලබාදීම	(3) නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුභ සාධනය ප්‍රවර්ධනය කිරීම	(3-2) 2030 වනවිට වයස අවුරුදු පහට අඩු ළමුන්ගේ වළක්වාගත හැකි මරණ තුරන් කිරීම	(3.3.5) සෞඛ්‍යමය මැදිහත්වීමක් සඳහා සහාය ලබාදුන් ළමුන් සංඛ්‍යාව (* 3.3.5 න්)			* 90%
නිවුන් දරු ආධාර ලබාදීම	(2) සාගින්න නැතිකර ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්ත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම	(2 -1) 2030 වනවිට දරුවන් සහ අවදානම් තත්ත්වයන්ට ලක් වී ඇති පවුල් සඳහා ප්‍රමාණවත් පෝෂණයක් වසර පුරා ලබා ගැනීමට හැකිබව තහවුරු කිරීම	(2.1.1) පෝෂණ ඌණතාවයෙන් පෙළෙණු ආධාර අවශ්‍ය ළමුන් සංඛ්‍යාව (* 2.1.1 අනුව)			* 95%
හදිසි විපත් ආධාර/ සෙනෙහස ආධාර/ ගංවතුර ආධාර වැඩසටහන්	(13) දේශගුණික විපර්යාසය හා ඒවායේ බලපෑම් වලට එරෙහිව කඩිනමින් ක්‍රියාත්මකවීම	(13 - ආ) අවම වශයෙන් සංවර්ධනය වූ රටවල සහ කුඩා දිවයින්වල පිහිටි සංවර්ධනය වෙමින් පවතින රටවල කාන්තාවන්, තරුණයින් සහ දේශීය හා ආන්තිකරණයට ලක් වූ ප්‍රජාවන්ද ඉලක්ක කර ගනිමින් කාලගුණික වෙනස්වීම් සඳහා ඵලදායි සැලසුම් සකස් කිරීමට හා කළමනාකරණය කිරීම සඳහා ධාරිතාවන් වැඩි දියුණු කිරීමේ යාන්ත්‍රණය ප්‍රවර්ධනය කිරීම	(13.2.බී.1) අඩු ආදායම් ලාභී දරුවන් ඉලක්ක කර ගනිමින් ආපදා තත්ත්වයන් මත සිදුවන බලපෑම් අවම කරවීමට අවශ්‍යවන මූල්‍ය සහාය ලබාදෙන ළමුන් සංඛ්‍යාව			* 97.5%
අධ්‍යාපන ආධාර/ කැපකරු දෙගුරු ආධාර	(4)පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා	(4-1) සියළුම ගැහැණු ළමුන් හා පිරිමි ළමුන් නිදහස්, සමාන සහ ගුණාත්මකභාවයෙන් ඉහළ, ප්‍රාථමික සහ	(4.1.1)ස්ත්‍රී පුරුෂ භාවය අනුව සියළුම මට්ටම්වල ඉගනුම ලබන දරුවන් සහ යෞවනයන් අතර			100%

සෙවණ සරණ ආධාර වැඩසටහන්	ඉගෙනීමේ අවස්ථාව සැලසීම	ද්විතීයික අධ්‍යාපනයක් සම්පූර්ණ කර සිටින බව තහවුරු කිරීම	කියවීමට සහ ගණිතමය කුසලතාවයන් සඳහා වන අවම මට්ටම් සහිත අයගේ ප්‍රමාණය			
අවදානම් දරුවන් සඳහා ආරක්ෂණ සැලසුම් සකස් කිරීම	(1) සියළු තැන්හි පවතින සෑම ආකාරයකම දුගීබව අවසන් කිරීම	(1.3.) පහල මට්ටමේ අයද ඇතුළත්ව සියළුම පුද්ගලයින් සම්බන්ධයෙන් ජාතික වශයෙන් සුදුසු වන්නා වූ සමාජ ආරක්ෂණ ක්‍රම ක්‍රියාවට නැංවීම, සහ 2030 වනවිට දරිද්‍රතාවයෙන් පෙලෙන සහ අවදානම් කණ්ඩායම් ප්‍රමාණවත් ලෙස එමඟින් ආවරණයවී තිබීම	(1.3.1) සමාජ ආරක්ෂණ තල/ ක්‍රම මගින් ආවරණය සැපයෙන ජනගහනයේ ස්ත්‍රී පුරුෂභාවය අනුව, ළමුන් රැකියා වියුක්ති පුද්ගලයන් වැඩිහිටියන් ආබාධිත පුද්ගලයන් ගර්භණී කාන්තාවන් ළදරුවන් රැකියා ආශ්‍රිත අනතුරු වලට ගොදුරු වූවන් සහ දරිද්‍ර මෙන්ම අවදානම් කණ්ඩායම් හි ප්‍රමාණය			* 75%
ළමා සමාජ/ ළමා සහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම	(4) පරිපූර්ණ, සාධාරණ, ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම	(4.7) 2030 වනවිට ඉගනුම ලබන සියළු දෙනා තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ දැනුම හා කුසලතාවයන් ලබාගෙන සිටීම. එයට තිරසර සංවර්ධනය පිළිබඳ අධ්‍යාපනය සහ තිරසර සංවර්ධන රටාවන් මානව අයිතිවාසිකම්, සාමය සහ ප්‍රචණ්ඩත්වයෙන් තොර සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම, ගෝලීය පුරවැසිභාවය හා සංස්කෘතික විවිධත්වය ඇගයීම සහ තිරසර සංවර්ධනයට සංස්කෘතිකමය වශයෙන් දායකවීම	(4.3.1) ස්ත්‍රී පුරුෂභාවය අනුව පූර්ව මාස 12 තුළ විධිමත් හා නොවිධිමත් අධ්‍යාපනය සඳහා යෞවනයන්ගේ සහ වැඩිහිටියන්ගේ සහභාගීත්ව අනුපාතය			93.6%

		අදහස් වේ.				
පුහුණු හා කුසලතා සංවර්ධනය	(16) තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයන් ඇති කිරීම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබාදීම සහ සෑම මට්ටමකම ඵලදායි, වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩ නැගීම	(16.6) සියළුම මට්ටම් වලදී ඵලදායි වගවීමෙන් යුක්ත සහ විනිවිද භාවයෙන් යුත් ආයතන පිහිටුවීම	(16.6.1) ප්‍රධාන රාජ්‍ය වියදම් අංශයන් අනුව (නැතහොත් අයවැය කේතයන් හෝ සමාන) මූලික අනුමත අයවැයෙන් පංගුවක් ලෙස			100%
පුහුණු කුසලතා සංවර්ධනය	(16) තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයන් ඇති කිරීම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබාදීම සහ සෑම මට්ටමකම ඵලදායි, වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩ නැගීම	(16.3)සියළුම දෙනාටම නීතියේ සාධාරණත්වය ලබා ගැනීම හැකිවීම සහ ජාතික සහ අන්තර්ජාතික මට්ටමින් නීතියේ ආධිපත්‍ය ප්‍රවර්ධනය කිරීම	(16.3.1.) දරුවන්ට වෙනස් කොට සැළකීම වැළැක්වීම සඳහා සමාජගත කරන ලද ළමයින් සංඛ්‍යාව/ වැඩි දියුණු කරන ලද ළමා නිවාස සංඛ්‍යාව (*)			* 100%

*දර්ශක අදාළ වන පරිදි සංශෝධනය කර ඇත.
*දර්ශක දෙපාර්තමේන්තුවට ලැබෙන අදාළ ඉල්ලීම් පදනම් කර සකස් කර ඇත.

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

අභියෝග:

1. දෙපාර්තමේන්තුවට අයත් සමස්ත මානව සම්පත මේ සම්බන්ධයෙන් නිශ්චිත පුහුණු වැඩසටහනක් ලබාදීමට නොහැකිවීම
2. ජයග්‍රහණ දර්ශක සකස් කිරීමේදී දෙපාර්තමේන්තු මූලික තොරතුරු මත පමණක් පදනම් වීමට සිදුවීම
3. දෙපාර්තමේන්තු කාර්යභාරයන් සමග සෘජුවම ඉලක්ක ගැලපීමේ ඇති දුෂ්කරතාවය

ජයග්‍රහණ:

1. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් තිරසර සංවර්ධන අරමුණු සමඟ ඉලක්ක ගත කිරීම.

මානව සම්පත් පැතිකඩ
06

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	අඩුවැඩි/ අතිරික්ත
ජ්‍යෙෂ්ඨ	**8**	**5**	**3**
තෘතීයික	**229**	**225**	**4**
ද්විතියික	**248**	**226**	**22**
ප්‍රාථමික	**17**	**13**	**4**

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය බලපානු ලැබ ඇති ආකාරය

අනුමත කාර්ය මණ්ඩල සංඛ්‍යාවට අනුව ළමා හිමිකම් ප්‍රවර්ධන සහකාර නිලධාරීන් 12 ක පමණ හිඟයක් පවතී. පුරප්පාඩු පිරවීමේ නොහැකියාව නිසා ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට සේවාව දීමට අපහසු වී ඇත. තවද නීති නිලධාරී තනතුර හා පරිවාස නිලධාරී තනතුර සඳහා නිලධාරීන් බඳවා ගැනීමට අදාල කටයුතු සිදු කෙරෙමින් පැවති නමුත් රාජ්‍ය වියදම් පාලනය සම්බන්ධයෙන් නිකුත් කරන ලද අංක 03/2022 දරණ අයවැය චක්‍රලේඛය හේතුවෙන් බඳවා ගැනීම් කල් තැබීමට සිදුවිය. නීති නිලධාරී පුරප්පාඩුව තවමත් පවතින බැවින් දෙපාර්තමේන්තුවට ලැබෙන නීතිමය ගැටලු වලදී බාහිර නීති නිලධාරීන්ගේ සහය ලබා ගැනීමට සිදුවී ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහන	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	කාල සීමාව	සමස්ථ ආයෝජනය		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම / ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
ප්‍රසම්පාදන සැලැස්ම පුහුණු වැඩමුළුව	03	දින 02	රු.21,000.00	-	දේශීය	විෂය ක්ෂේත්‍රයන්ට අදාල දැනුම ලබා දීම.
සමාජ විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියේ දෙවන වසර සඳහා	01		රු.10,000.00	-	දේශීය	විෂය අනුව රාජකාරී සාර්ථකව ඉටු කිරීම.
අත්තිකාරම් බිඳ ගිණුම	01	දින 01	රු.3,750.00	-	දේශීය	විෂය අනුව රාජකාරී සාර්ථකව ඉටු කිරීම.
සේවාරම්භක පුහුණු වැඩමුළුව	02	දින 03	රු.21,000.00	-	දේශීය	විෂය අනුව රාජකාරී සාර්ථකව ඉටු කිරීම.
රජයේ මුදල් රෙගුලාසි	02	දින 02	රු.18,000.00	-	දේශීය	රාජකාරී විෂය ක්ෂේත්‍රයන්ට අදාල

						දැනුම.
රාජ්‍ය ගිණුම්කරණ ක්‍රමවේදය දැනුවත් කිරීම හා අවසාන ගිණුම් පිළියෙල කිරීම	02	දින 02	රු.15,000.00	-	දේශීය	විෂය අනුව රාජකාරී සාර්ථකව ඉටු කිරීම.
කඩඉම් විභාගය පූර්ව සැලසුම්	02		රු.44,276.66 (50%)	-	දේශීය	විෂය අනුව රාජකාරී සාර්ථකව ඉටු කිරීම.
ළමා ආරක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධිය සඳහා (මුළු මුදලින් කොටසක්)	33	වසර 02	රු.73,000.00	-	දේශීය	විෂය ක්ෂේත්‍රයන්ට අදාල දැනුම ලබා දීම / රාජකාරී වගකීම හා ස්වභාවය හඳුනා ගැනීම.
සමාජ විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියේ දෙවන වසර සඳහා	01	වසර 2	රු.60,000.00 (70%)	-	දේශීය	විෂය අනුව රාජකාරී සාර්ථකව ඉටු කිරීම.
කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ ආයතන කටයුතු හා මුදල් රෙගුලාසි විෂය සඳහා	01	දින 01	රු.12,616.25 (50%)	-	දේශීය	රාජකාරී විෂය ක්ෂේත්‍රයන්ට අදාල දැනුම
දර්ශනපති උපාධි පර්. දෙවන වසර සඳහා	01	වසර 02	රු.36,750.00	-	දේශීය	විෂය ක්ෂේත්‍රයන්ට අදාල දැනුම ලබා දීම / රාජකාරී වගකීම හා ස්වභාවය හඳුනා ගැනීම.
සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය	01		රු. 84,000.00 (70%)	-	දේශීය	විෂය ක්ෂේත්‍රයන්ට අදාල දැනුම ලබා දීම / රාජකාරී වගකීම හා ස්වභාවය හඳුනා ගැනීම.

6.4 ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන ආකාරය

ජාතික හා ජාත්‍යන්තර ප්‍රතිපත්ති වලට අනුකූලව ළමා අයිතිවාසිකම් භුක්ති විඳීමට දරුවන්ට අවස්ථාව සැලසීම දැක්ම කරගත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ දැනුම, ආකල්ප, කුසලතා යාවත්කාලීන කිරීම අත්‍යවශ්‍ය කාර්යයකි. ඊට හේතුව සමාජයේ සිදුවන වෙනස්වීම් හමුවේ අභියෝගයට මුහුණ දෙන ප්‍රධාන සමාජ කාණ්ඩය වන්නේ ළමුන්ය. එම අභියෝගයන් හඳුනාගෙන ඒවාට සාර්ථකව මුහුණ දීමට අවශ්‍ය සහය ලබා දීමට යාවත්කාලීන වූ වෘත්තීය දැනුමකින් යුත් නිලධාරීන් පිරිසක් සිටීම අත්‍යවශ්‍ය වූ කාර්යයකි. ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් හා ළමා හිමිකම් ප්‍රවර්ධන සහකාරවරුන් සඳහා කාලීනව සිදුවන සමාජ වෙනස්වීම් හමුවේ ළමුන් ආමන්ත්‍රණය කළ යුතු ක්ෂේත්‍රයක් පිළිබඳ විධිමත් දැනුමක් ලබා දී වඩා කාර්යක්ෂම, ඵලදායී සේවාවක් ලබා දීමට අපේක්ෂා කෙරේ.

එමෙන්ම දෙපාර්තමේන්තුවේ සේවයේ නියැලෙන සෙසු නිලධාරීන් වන කළමනාකරණ සේවා නිලධාරීන්, කාර්යාල කාර්යය සේවක නිලධාරීන් සඳහා ද පුහුණුවීම් සිදු කරනුයේ කාර්යාලයීය කටයුතුවල ඵලදායීතාව වැඩිදියුණු කිරීමේ අපේක්ෂාවෙනි.

07
අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූලතා නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අනුකූල නොවේ	වාණිජ ව්‍යාපාරයක් නොවේ	
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ	වාණිජ ව්‍යාපාරයක් නොවේ	
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ		
1.6	වෙනත්			
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මූ.රෙ 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන	අනුකූල වේ		

	යාම			
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දීම	අනුකූල වේ		
3.2	මූලය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුල දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ	අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශයෙන් සිදු කරනු ලබයි	
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම් වලට පිළිතුරු	අනුකූල වේ		

	ලබා දී තිබීම			
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ 134(2) DMA/1-2019 අනුව වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ	අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශයෙන් සිදු කරනු ලබයි	
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශයෙන් සිදු කරනු ලබයි	
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශයෙන් සිදු කරනු ලබයි	
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වා ගෙන තිබීම	අනුකූල නොවේ	අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශයෙන් සිදු කරනු ලබයි	
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක	අනුකූල වේ		

	05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම			
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුල සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක් දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල නොවේ.	වාහන සඳහා ඉන්ධන සීමිත ප්‍රමාණයක් නිකුත් කිරීම හේතුවෙන් මෙම වර්ෂයේදී වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම සිදු කිරීමට නොහැකි වූ අතර ඉදිරියේදී ඉටු කිරීමට අපේක්ෂා කරයි.	
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින්	අනුකූල වේ		

	අනාවරණය වූ හා ගැලපුම් කල යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම			
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු වර්ෂය අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම	අනුකූල වේ		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත්කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව,	අනුකූල නොවේ	ආදායම් උපයන	

	රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම		දෙපාර්තමේන්තුවක් නොවේ	
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	ආදායම් උපයන දෙපාර්තමේන්තුවක් නොවේ	
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්යය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥාප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 () දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූලවේ.		

18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස්කොට තිබීම	අනුකූල වේ.		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ.		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ.		
19.4	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ.		
19.4	ඉහත සඳහන් චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ.		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විමසිම් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ.		